ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2141/78 - 2019 සැප්තැම්බර් මස 20 වැනි සිකුරාදා - 2019.09.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78 (XVI)(A)

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 18 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලබන නියමාවලිය

**ලේකම්,**
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2019 සැප්තැම්බර් මස 18 දින,

**නියමාවලිය**

1\. මේ නියමාවලිය 2019 අංක 03 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අතර, එය 2019 .09.09 දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

2\. මේ නියමාවලිය 2019 අංක 2141/13 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද (මෙහි මින් මතු ‘‘පනත’’ යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ(1) වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියමය මගින් පිහිටුවනු ලැබූ (මෙහි මින්මතු ‘‘ආයතනය’’ යනුවෙන් සඳහන් කරනු ලබන) වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

3\. මේ ආයතනය, (මෙහි මින් මතු ‘‘විශ්වවිද්‍යාලය’’ යනුවෙන් සඳහන් කරනු ලබන පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ වන්නේය.

4\. පනතේ, නියමාවලියේ සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට සහ (මෙහි මින් මතු ‘‘කොමිෂන් සභාව’’ යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ විශ්වවිද්‍යාලයේ බලතල, කාර්ය සහ කර්තව්‍යයන්ට යටත්ව ආයතනයට -

(අ) සිසුන් ඇතුළත් කර ගැනීම ;

(ආ) විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව සහ ආයතනයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි පරිදි වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍රවල ඉගැන්වීම්, පුහුණුකිරීම් සහ පර්යේෂණ සඳහා පහසුකම් සැලැස්වීම ;

(ඇ) විශ්වවිද්‍යාලයේ අනුමතයත් කොමිෂන් සභාවේ එකඟත්වයත් ඇතිව, වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍රවල ප්‍රදානය කළ යුතු පශ්චාත් උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා සහ සුදුසුකම් නිශ්චය කිරීම ;

(ඈ) වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍රවල ප්‍රවීණතාව අත්පත් කරගත් තැනැත්තන් තීරණය කර ගැනීමේ කාර්ය සඳහා විශ්වවිද්‍යාලයේ අනුමතය ඇතිව, විභාග පැවැත්වීම සහ එම විභාගවලින් සාමාර්ථය ලබා, විශ්වවිද්‍යාලය විසින් ආයතනය විමසීමෙන් පසු සාදනු ලැබිය හැකි අතුරු ව්‍යවස්ථා මගින් නියම කරන ලද වෙනත් කොන්දේසි සහ අවශ්‍යතා සපුරාලීමෙන් පශ්චාත් උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර, විශේෂඥ හඳුනා ගැනීම (විශේෂඥ ක්ෂේත්‍රවල මණ්ඩල සහතිකය) සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීමට සුදුසුකම් ලැබූ තැනැත්තන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ;

(ඉ) ආයතනයේ අරමුණුවලට සමාන වන්නා වූ හෝ ඒවාට බොහෝ සෙයින් සමාන වන්නා වූ අරමුණු ඇති, ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත විශ්වවිද්‍යාල හෝ ආයතන සමග ගුරුවරුන්, ශාස්ත්‍රවේදීන්, ශිෂ්‍යයන් හුවමාරු කර ගැනීම මගින් හෝ අන්‍යාකාරයෙන් එම ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම ;

(ඊ) අතුරු ව්‍යවස්ථාවකින් නියම කරනු ලැබිය හැකි පරිදි ආයතනයට ඇතුල්වීමට අපේක්ෂා කරන තැනැත්තන් හෝ ආයතනයේ ශිෂ්‍යයන් හෝ විශ්වවිද්‍යාලවලදී හෝ විශ්වවිද්‍යාල මට්ටමේ අධ්‍යයන ආයතනවලදී සාමාර්ථය ලත් විභාග හා ගත කළ අධ්‍යයන කාල සීමාව, ආයතනයේ එවැනි විභාගවලට හා එවැනි අධ්‍යයන කාල සීමාවලට හෝ ඉන් යම් කොටසකට සමාන ලෙස සලකනු ලැබීම හා ඕනෑම අවස්ථාවක ඒ සලකනු ලැබීම ඉවත් කර ගැනීම ;

(උ) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි අධ්‍යයන, පරිපාලන සහ වෙනත් තනතුරු ඇති කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම සහ එම තනතුරු අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට විධිවිධාන සැලසීම ;

(ඌ) ආයතනයේ ඉගැන්වීමේ, පුහුණු කිරීමේ, සායනික සේවා හෝ පර්යේෂණ කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය වන පුස්තකාල, රසායනාගාර, පන්තිකාමර. රෝහල් සහ වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම, ඒවාට උපකරණ සැපයීම සහ ඒවා පවත්වාගෙන යෑම ;

(එ) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ශිෂ්‍යාධාර, පදක්කම් සහ වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම;

(ඒ) පර්යේෂණ සහ පාඨමාලා හෝ පාඨමාලා වල කොටස් විශ්වවිද්‍යාලයෙන් සහ ආයතනයෙන් බාහිර වූ ස්ථානවල පැවැත්වීමට කටයුතු සැලැස්වීම සඳහා විධිවිධාන සලස්වන යම් අතුරු ව්‍යවස්ථාවක් අනුව එසේ කටයුතු සැලැස්වීම;

(ඔ) විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව, ආයතනය විසින් අනුමත කරන ලද තැනැත්තන් ආයතනයේ ආචාර්යවරුන්, පුහුණු කරුවන් සහ පරීක්ෂකවරුන් ලෙස පිළිගැනීම;

(ඕ) ආයතනයේ පරමාර්ථ ඉටුකරගැනීම සඳහා වෙනත් සමාන ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම;

(ක) ගාස්තු ඉල්ලීම හා භාරගැනීම සඳහා විධිධාන සලස්වන යම් රීතියක් අනුව සහ රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව ගාස්තු ඉල්ලීම සහ භාර ගැනීම ; සහ

(ග) ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට හා කිරීමට ආනුශංගික හෝ ඒ හේතුවෙන් අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම;

සඳහා බලය තිබිය යුතුය

5. ආයතනයේ නිලධරයන් පහත පරිදි විය යුතුය-

(අ) අධ්‍යක්ෂවරයා;

(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා; සහ

(ඇ) වෙනත් යම් තනතුරක් දරන තැනැත්තෙකු මේ ඡේදයේ කාර්ය සඳහා නිලධරයෙකු බව නියමාවලිය මඟින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේද, එකී තනතුරක් දරන තැනැත්තෙකු.

6. (1) විශ්වවිද්‍යාලය විමසා කොමිෂන් සභාව විසින් ප්‍රථම අධ්‍යක්ෂවරයා තෝරා පත් කරනු ලැබිය යුතුය.

(2) පසුව පත්වන සෑම අධ්‍යක්ෂවරයෙකුම නියමාවලියේ 9 වන ඡේදය යටතේ සංස්ථාපනය කරන ලද (මෙහි මින්මතු “මණ්ඩලය” යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් නම් කරන ලද තැනැත්තන් තිදෙනෙකුගෙන් සැදුම්ලත් මූල මණ්ඩලයක් අතරින් කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබිය යුතුය.

එසේ වුව ද, කිසිදු තැනැත්තෙකු අනුක්‍රමික ධූර කාල දෙකකට වඩා ආයතනයේ අධ්‍යක්ෂවරයා ලෙස පත් කරනු නොලැබිය යුතුය.

(3) උසස් අධ්‍යාපන ආයතනයක හෝ උසස් අධ්‍යාපන විද්‍යාතනයක කාර්ය මණ්ඩලයක සාමාජිකයෙකු, අධ්‍යක්ෂවරයෙකු ලෙස තෝරා පත් කරනු ලබන අවස්ථාවකදී, එසේ තෝරා පත් කරගනු ලැබූ කාර්ය මණ්ඩල සාමාජිකයා අධ්‍යක්ෂ තනතුර භාරගැනීම සඳහා ඒ ආයතනය හෝ විද්‍යායතනය විසින් මුදා හැරිය යුතුය.

(4) අධ්‍යක්ෂවරයෙකු කලින් ධූරය අතහැරියහොත් මිස, හෝ (5) වන අනුඡේදය යටතේ ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, පත් කරනු ලැබූ දින සිට ගණන් බලන වර්ෂ තුනක කාලසීමාවක් ගතවීම හෝ ඔහුගේ විශ්‍රාම යෑමේ වයස සම්පූර්ණ වීම යන මේ අවස්ථා දෙකින් කලින් එළඹෙන අවස්ථාව තෙක් ධූරය දරන්නේය

(5) අධ්‍යක්ෂවරයෙකු, දෝෂාරෝපණ යෝජනාවක් සම්මත කර ගැනීම සඳහා කැඳවනු ලැබූ විශේෂ රැස්වීමක දී, ඒ මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්ද සංඛ්‍යාවකින් සම්මත කරගනු ලැබූ දෝෂාරෝපණ යෝජනාව මත, කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය. නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ඒ විශේෂ රැස්වීමේ මුලසුන දැරිය යුතුය. නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා පැමිණ නොමැති අවස්ථාවකදී ඒ විශේෂ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින්, ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා ඔවුන් අතරින් තැනැත්තකු තෝරා පත් කරනු ලැබිය යුතු ය.

(6) අධ්‍යක්ෂවරයා විශ්වවිද්‍යාල සනාතන සභාවේ විනය පාලනයට යටත් විය යුතු ය.

(7) ධූරයෙන් ඉල්ලා අස්වන හෝ ඉවත් කරනු ලබන හෝ ස්වකීය ධූර කාලය අවසන් කරන්නා වූ අධ්‍යක්ෂවරයකු, අධ්‍යක්ෂවරයකු වශයෙන් තමා පත්කරනු ලැබීමට පෙරාතුවම, උසස් අධ්‍යාපන ආයතනයක හෝ උසස් අධ්‍යාපන විද්‍යායතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුව සිටියේ නම් සහ ඔහු කලින් දැරූ තනතුරින් විශ්‍රාම ගැනීමේ වයසට එළඹී නොමැති නම්, එකී උසස් අධ්‍යාපන ආයතනයේ හෝ උසස් අධ්‍යාපන විද්‍යායතනයේ ඔහුගේ නිත්‍ය තනතුරට ඔහු පෙරලා පැමිණිය හැකි ය.

(8) නිවාඩු පිට සිටීම, රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනයම් හේතුවක් නිසා තම ධූරයේ කාර්ය ඉටු කිරීමට අධ්‍යක්ෂවරයාට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක දි, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා විසින් ඒ කාර්යයන් ඉටු කළ යුතු ය. අධ්‍යක්ෂවරයා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා යන දෙදෙනාටම එසේ කාර්ය කිරීමට නොහැකි වන අවස්ථාවකදී, එසේ කාර්ය ඉටු කිරීමට නොහැකි

වීමෙන් දින හතක් ඇතුළත, ඒ ධුරයේ කාර්ය ඉටු කිරීම සඳහා සුදුසු යයි කොමිෂන් සභාව අදහස් කරන වැඩපිළිවෙලක් කොමිෂන් සභාව විසින් සලසනු ලැබිය යුතු ය. එසේ වැඩපිළිවෙලක් සලසනු ලබන තෙක් විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පීඨාධිපතිවරයා විසින් ඒ ධුරයේ එදිනෙදා කාර්ය කරගෙන යා යුතු ය

(9) අධ්‍යක්ෂ ධුරයේ යම් පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී (1) වන අනුඡේදය යටතේ ස්ථිර පත්කිරීමක් සිදු කරනු ලබන තෙක් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා විසින් අධ්‍යක්ෂ ධුරයේ කාර්යයන් ඉටු කළ යුතු ය. නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාට එසේ කිරීමට නොහැකිවන අවස්ථාවක දී කොමිෂන් සභාව විසින්, එම නොහැකියාව ඇති වී දින හතක් ඇතුළත (1) වන අනුඡේදය යටතේ ස්ථිර පත්කිරීමක් සිදු කරනු ලබන තෙක් අධ්‍යක්ෂවරයාගේ ධුරයේ කාර්ය ඉටු කිරීම සඳහා සුදුසු යැයි කොමිෂන් සභාව අදහස් කරන වැඩපිළිවෙළක් කොමිෂන් සභාව විසින් සලසනු ලැබිය යුතු ය. එසේ වැඩපිළිවෙළක් යොදන තෙක් විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පීඨාධිපතිවරයා විසින් ඒ ධුරයේ එදිනෙදා කාර්ය කරගෙන යා යුතු ය.

(10) අධ්‍යක්ෂවරයා ආයතනයේ පූර්ණ කාලීන නිලධරයකු විය යුතු අතර එහි ප්‍රධාන විධායක නිලධරයා සහ ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා විය යුතු ය. ඔහු නිලබලයෙන් මණ්ඩලයේ සාමාජිකයකු සහ සභාපතිවරයා විය යුතු අතර නිල බලයෙන් එක් එක් අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයකු විය යුතු ය. ආයතනයේ වෙනයම් බල මණ්ඩලයක හෝ පුද්ගල මණ්ඩලයක රැස්වීමක් කැඳවීමට, ඒ රැස්වීමකට පැමිණ සිටීමට සහ එහි දී කතා කිරීමට ඔහුට හිමිකම් ඇති නමුදු, ඔහු ඒ බල මණ්ඩලයේ හෝ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයකු වන්නේ නම් මිස, එවැනි යම් රැස්වීමක දී ඡන්දය ලබා දීමට ඔහුට හිමිකම් නොමැත්තේ ය.

(11) මණ්ඩලය හෝ එක් එක් අධ්‍යයන මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා නීත්‍යානුකූලව වරින් වර තමා වෙත නිකුත් කරනු ලැබිය හැකි විධානවලට අනුකූලව පනතේ, නියමාවලියේ හෝ වෙනත් යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන ආයතනයට අදාළ වන තාක් දුරට, ඒ විධිවිධාන යථා පරිදි පිළිපදින බවට වගබලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය. ඒ සඳහා මණ්ඩලයේ හෝ එක් එක් අධ්‍යන මණ්ඩලයේ තීරණවලට බලය ලබාදෙමින් ඒ කාර්යය සඳහා අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන සියලු බලතල ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(12) මණ්ඩලයේ සහ එක් එක් අධ්‍යයන මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කෙරෙන බවට වගබලා ගැනීම හෝ අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය.

(13) අධ්‍යක්ෂවරයා ආයතනයේ ගිණුම් නිලධරයා වන්නේ ය.

(14) විනය, පරිපාලනය සහ අධ්‍යයන තත්වය සහ ආයතනය තුළ ප්‍රමිතිය පවත්වාගෙන යාම පිළිබඳව අධ්‍යක්ෂවරයා වගකිව යුතු ය

7 (1) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා තත්කාර්ය සඳහා පත්කරන ලද තේරීම් කමිටුව විසින් සිදුකළ ඉදිරිපත් කිරීම් මත පදනම්ව මණ්ඩලය විසින් නිර්දේශ කළ පරිදි සනාතන සභාව විසින් පත් කරනු ලැබිය යුතු අතර ඔහු ආයතනයේ පූර්ණ කාලීන නිලධරයකු විය යුතු ය.

(2) උසස් අධ්‍යාපන ආයතනයක හෝ උසස් අධ්‍යාපන විද්‍යායතනයක කාර්ය මණ්ඩලයක සාමාජිකයකු, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ලෙස තෝරා පත් කරනු ලබන අවස්ථාවක දී, එසේ තෝරා පත් කරගනු ලැබූ කාර්ය මණ්ඩල සාමාජිකයා නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර භාර ගැනීම සඳහා මුදා හැරිය යුතු ය.

(3) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා, කලින් ධුරය අත්හැරියහොත් මිස, හෝ (3) වන අනුඡේදය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, පත් කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන වර්ෂ තුනක කාල සීමාවක් ගතවීම හෝ ඔහුගේ විශ්‍රාම යැමේ වයස සම්පූර්ණ වීම යන මේ අවස්ථා දෙකින් කලින් එළඹෙන අවස්ථාව තෙක් ධුරය දරන්නේ ය. කිසිදු තැනැත්තකු අනුක්‍රමික ධුර කාලය දෙකකට වඩා ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ලෙස පත් කරනු නොලැබිය යුතු ය.

(4) දෝෂාරෝපණ යෝජනාවක් සම්මත කර ගැනීම සඳහා කැඳවනු ලැබූ විශේෂ රැස්වීමක දී ඒ මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කරගනු ලබන දෝෂාරෝපණ යෝජනාව මත, පාලක සභාව විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(5) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ කාර්ය සහ කර්තව්‍යන් අධ්‍යක්ෂවරයා විමසා මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර අධ්‍යක්ෂවරයාගේ විධානය සහ පාලනය යටතේ එකී කාර්ය සහ කර්තව්‍යයන් ඉටු කරනු ලැබිය යුතු ය.

8. ආයතනය පහත සඳහන් බලමණ්ඩලවලින් සමන්විත විය යුතු ය.

(අ) මණ්ඩලය ;

(ආ) අධ්‍යයන මණ්ඩලය ; සහ

(ඇ) එහි අධිකාරීන් ලෙස සලකනු ලැබිය යුතු නියමාවලිය මගින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් පුද්ගල මණ්ඩල.

9. (1) මණ්ඩලය, ආයතනයේ ශාස්ත්‍රීය සහ විධායක මණ්ඩලය විය යුතු අතර, එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) පහත දැක්වෙන නිලබලයෙන් පත්වන සාමාජිකයන්, එනම්

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ;

(ඇ) විශ්වවිද්‍යාලයේ සියලු පීඨවල පීඨාධිපතිවරු ;

(ඈ) උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු ;

(ඉ) සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු ;

(ඊ) මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු ;

(උ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ නාමිකයකු ;

(ඌ) ආයතනයේ හිටපු ආසන්නතම අවසාන අධ්‍යක්ෂවරයා ; සහ

(එ) කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ නාමිකයකු,

(ආ) පහත දැක්වෙන අනෙකුත් පත්කළ සාමාජිකයන්, එනම් ;-

(අ) කොමිෂන් සභාව විසින් නම් කරන ලද තැනැත්තන් පස් දෙනෙකු ;

(ආ) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ දෙපාර්තමේන්තුවල අංශාධිපතීන් හෝ මහාචාර්යවරුන් අතරින් වෛද්‍ය පීඨ මණ්ඩලය විසින් තෝරා පත් කරන සාමජිකයන් තුන්දෙනෙකු;

(ඇ) පාලක සභාවේ සාමාජිකයන් අතරින් සභාව විසින් නම් කළ එක් සාමාජිකයකු ; සහ

(ඈ) අධ්‍යාපන, නීති, වෘත්තීය, විද්‍යාත්මක, කාර්මික, වෛද්‍ය හෝ පරිපාලන විෂය ක්ෂේත්‍රවල විශිෂ්ට සේවාවක් ලබා දී ඇති තැනැත්තන් අතරින් මණ්ඩලයේ නිර්දේශය මත පාලක සභාව විසින් නම් කරන ලද සාමාජිකයන් දෙදෙනකු.

(2) මණ්ඩලය විසින් යම් තැනැත්තකු විශේෂිත කාර්යයක් සඳහා සහ නිශ්චිතව සඳහන් කරන ලද කාලසීමාවක් සඳහා අනුයුක්ත කරගනු ලැබිය හැකි මුත් එසේ අනුයුක්ත කරගත් කිසිදු තැනැත්තකුට කිසිදු රැස්වීමක දී තෝරාපත් කර ගැනීම හෝ ඡන්දය දීම සඳහා ඉදිරිපත් වීමට හිමිකම් නොමැති විය යුතු ය.

10\. (1) මණ්ඩලයේ සභාපතිවරයා, අධ්‍යක්ෂවරයා විය යුතු අතර ඔහු මණ්ඩලයේ සියලුම රැස්වීම්වල මුලසුන දැරිය යුතුය. මණ්ඩලයේ යම් රැස්වීමක මුලසුන දැරීමට සභාපතිවරයාට නොහැකි වන්නේ නම්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා විසින් ඒ රැස්වීමේ මුලසුන දැරිය යුතුය. ඒ රැස්වීමේ මුලසුන දැරීමට නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාට නොහැකි වන්නේ නම් පැමිණ සිටින සාමාජිකයින් අතරින් යම් සාමාජිකයකු ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරාපත් කරගත යුතු ය.

(2) කලින් ධුරය අත්හැරියහොත් මිස, අවස්ථාවෝචිත පරිදි, තෝරාපත් කරගනු ලැබූ හෝ පත් කළ යම් සාමාජිකයකු, ඔහු එසේ තෝරාපත් කරගනු ලැබූ හෝ පත් කරනු ලැබූ දින සිට ගණන් ගැනෙන වසර තුනක කාල සීමාවක් සඳහා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත්කරනු ලැබුවහොත් මිස, නැවත තෝරාපත් කරනු ලැබීමට හෝ නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු වන්නේ ය.

එසේ වුව ද, තෝරාපත් කර ගනු ලැබූ හෝ පත් කරනු ලැබූ යම් සාමාජිකයකු, ඔහුගේ ධුර කාලය ඉකුත් වීමට ප්‍රථම ධුරය අත්හැර ගියහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින් ඔහු ද කලින් ධුරය අත්හැර ගියහොත් මිස, තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

එසේම තවදුරටත්, තෝරාපත් කරනු ලැබූ සෑම සාමාජිකයෙක්ම, මණ්ඩලයේ සාමාජිකයකු ලෙස තෝරාපත් කරනු ලැබුවේ යම් තරාතිරමක් හෝ සාමාජිකත්වයක් ප්‍රකාරව ද, ඒ තරාතිරම හෝ සාමාජිකත්වය දරන තාක්කල් ඔහු මණ්ඩලයේ සාමාජික ධුරය දැරිය යුතුය.

(3) මණ්ඩලයේ තෝරාපත් කරනු ලැබූ යම් සාමාජිකයකු විසින් ස්වකීය අත්සන යටතේ අධ්‍යක්ෂවරයා අමතා යවන ලිඛිත ලිපියක් මගින්, තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(4) යම් පත් කරනු ලැබූ සාමාජිකයකු විසින් කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ අදාළ ආයතනයේ ප්‍රධානියා අමතා ස්වකීය අත්සන යටතේ යවනු ලබන ලිඛිත ලිපියක් මගින් තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(5) මණ්ඩලයේ යම් තෝරාපත් කරගනු ලැබූ හෝ පත් කරනු ලැබූ සාමාජිකයකු අවසර නොලබා මණ්ඩලයේ අනුක්‍රමික රැස්වීම් තුනකට පැමිණීම පැහැර හැරියහොත් ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ඔහුගේ ධුරය අත්හැරිය සේ සැලකිය යුතු අතර, ඒ හේතුවෙන් ඇතිවන පුරප්පාඩුව පිරවීම පිණිස සුදුසු තැනැත්තකු පත් කිරීමට අදාළ අධිකාරිය විසින් ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු ය.

(6) අමාත්‍යවරයා විසින් මුදල් විෂයභාර අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලබන පාරිශ්‍රමිකයක් හෝ දීමනාවක් මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය යුතු ය.

(7) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා සන පූර්ණය මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(8) අවශ්‍ය වන කවර අවස්ථාවක වුව ද මණ්ඩලය රැස් විය යුතු ය. එසේ වුව ද, එක් ලිත් වර්ෂයක් තුළදී දස වාරයකට නොඅඩු වාර ගණනක් මණ්ඩලය රැස් විය යුතු ය.

(9) අධ්‍යක්ෂකවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන කවර හෝ අවස්ථාවක දී හෝ මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු සාමාජික සංඛ්‍යාවක් විසින් ඉදිරිපත් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් අධ්‍යක්ෂවරයා වෙත ලැබී සතියක් ඇතුළත හෝ මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය.

11\. (1) නියමාවලියේ, පනතේ සහ යම් උචිත සාධනපත්‍රයක විධිවිධානවලට යටත්ව ආයතනයේ සායනික පුහුණුව, පර්යේෂණ සහ විභාගවලට අදාළ ඉගැන්වීම, අධ්‍යාපනය හා සායනික සේවා පිළිබඳ පාලනය සහ මෙහෙයවීම මණ්ඩලය සතු වන්නේ ය.

(2) (1) වන අනුඡේදය මගින් මණ්ඩලයට පවරනු ලැබූ පොදු බලතලවලට අගතියක් නොමැතිව, පහත සඳහන් බලතල, කාර්ය සහ කර්තව්‍ය මණ්ඩලය විසින් භාවිතා කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(අ) විශ්වවිද්‍යාලයේ නියමයන්ට යටත්ව ආයතනයේ දේපළ සහ අරමුදල් දැරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම ;

(ආ) මේ පනතේ සහ වෙනත් යම් උචිත සාධනපත්‍රයක විධිවිධානවලට අනුකූලව ආයතනය හා සම්බන්ධ සියලු කාරණා විධිමත් කිරීම සහ නිශ්චය කිරීම ;

(ඇ) නිශ්චිත කාර්ය සඳහා ආයතනය ලබා දෙන අරමුදල් විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව පරිපාලනය කිරීම ;

(ඈ) ආයතනය වෙත ලබා දෙන රික්තවරණ, පරිත්‍යාග සහ ප්‍රදානයන් විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව භාර ගැනීම සහ පිළිගැනීම ;

(ඉ) ආයතනයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම් ප්‍රකාශය සලකා බැලීම සහ එම වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය විශ්වවිද්‍යාලයට සහ කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම ;

(ඊ) මෙම වර්ෂය සහ ලබන වර්ෂය සඳහා වන ආයතනයේ මූල්‍ය ඇස්තමේන්තු සකස් කිරීම සහ ඒ ඇස්තමේන්තු විශ්වවිද්‍යාලයට සහ කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම ;

(උ) වෛද්‍ය විද්‍යා අධ්‍යයනයෙහි විවිධ විශේෂඥ ක්ෂේත්‍රවල ප්‍රදානය කළ යුතු පශ්චාත් උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිළිබඳවත්, සහ එවැනි උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතාවලට සුදුස්සන් වීමේ අභිලාෂය ඇති ශිෂ්‍යයන් විසින් හැදෑරිය යුතු අධ්‍යයන පාඨමාලා සහ ලැබිය යුතු පුහුණුව පිළිබඳවත්, සාමාර්ථය ලැබිය යුතු විභාග සහ සපුරාලිය යුතු වෙනත් කොන්දේසි පිළිබඳවත් අදාළ අධ්‍යයන මණ්ඩල හෝ අධ්‍යයන මණ්ඩලය විමසා විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ;

(ඌ) අතුරු ව්‍යවස්ථා සෑදීමට බලය දෙනු ලැබ ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද, ඒ කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් කිරීම සහ එකී කෙටුම්පත් පැනවීම සඳහා විශ්ව විද්‍යාලයේ පාලක සභාවට ඉදිරිපත් කිරීම ;

එසේ වුව ද, අදාළ අධ්‍යයන මණ්ඩලයේ හෝ මණ්ඩලවල වාර්තා සලකා බැලීමෙන් අනතුරුව මිස, අධ්‍යයන පාඨමාලා සහ විභාග සම්බන්ධයෙන් කිසිදු අතුරු ව්‍යවස්ථාවක් කෙටුම්පත් නොකළ යුතු ය ;

(එ) අදාළ අධ්‍යයන මණ්ඩලයේ හෝ මණ්ඩලවල වාර්තා සලකා බැලීමෙන් පසු ආයතනයේ අධ්‍යයන පාඨමාලාවලට සහ විභාගවලට අදාළ නියෝග සහ විශේෂඥයන් ලෙස තැනැත්තන් හඳුනා ගැනීමට අදාල නියෝග කෙටුම්පත් කිරීම සහ එම නියෝග (මෙහි මින්මතු "සනාතන සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්ව විද්‍යාලයේ සනාතන සභාවට ඉදිරිපත් කිරීම ;

(ඒ) රීති සෑදීමට බලය දෙනු ලැබ ඇත්තේ හෝ රීති සෑදීම අවශ්‍ය වන්නේ යම් කාරණා සම්බන්ධයෙන් ද, ඒ කාරණා සම්බන්ධයෙන් රීති කෙටුම් පත් කර, ඒ කෙටුම්පත් අවස්ථාවෝචිත පරිදි, විශ්වවිද්‍යාලයේ පාලක සභාවට හෝ සනාතන සභාවට ඉදිරිපත් කිරීම ;

(ඔ) ආයතනයේ භාවිතය සඳහා අවශ්‍ය වන පරිශ්‍ර, ගොඩනැගිලි, ගෘහභාණ්ඩ, උපකරණ සහ වෙනත් ද්‍රව්‍ය සැපයීම ;

(ඕ) (i) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ධූර, මහාචාර්ය ධූර සහාය මහාචාර්ය ධූර, ජ්‍යෙෂ්ඨ කථාකාචාර්ය ධූර, කථිකාචාර්ය ධූර සහ ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් අධ්‍යයන තනතුරු ඇති කිරීම, අහෝසි කිරීම හෝ අත්හිටුවීම; සහ

(ii) ආයතනයේ ආචාර්යවරයන්, පරීක්ෂකවරයන්, පුහුණුකරුවන්, නිලධරයන් සහ වෙනත් සේවකයන් වශයෙන් පත් කරනු ලබන තැනැත්තන්ට තිබිය යුතු සුදුසුකම් සම්බන්ධයෙන් ද, පාලක සභාවට නිර්දේශ කිරීම.

(ක) ආයතනයෙහි සේවයේ නියුක්ත තැනැත්තන්ගේ සේවය හෝ ශිෂ්‍යයන්ගේ ශිෂ්‍යභාවය අත්හිටුවීම, ඉවත් කිරීම හෝ විනයානුකූල ක්‍රියා මාර්ග ගැනීම සම්බන්ධයෙන් පාලක සභාවට නිර්දේශ කිරීම ;

(ග) ආයතනයේ ආචාර්යවරයන්, පුහුණුකරුවන් සහ පරීක්ෂකවරයන් වශයෙන් පිළිගැනීමට සුදුසු තැනැත්තන් පාලක සභාවට නිර්දේශ කිරීම ;

(ච) අදාළ අධ්‍යයන මණ්ඩලය හෝ අධ්‍යයන මණ්ඩලවල වාර්තා සලකා බැලීමෙන් පසුව -

(i) දැනට පවත්නා අධ්‍යයන මණ්ඩල ප්‍රතිසංවිධානය කිරීම සහ නව අධ්‍යයන මණ්ඩල පිහිටුවීම සඳහා යෝජනා ක්‍රම ; සහ

(ii) අදාළ අධ්‍යයන මණ්ඩලවලට විශේෂඥ වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍ර පැවරීම,

පිළිබඳව විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ;

(ජ) අවශ්‍ය යයි පෙනී යන සංඛ්‍යාවක ස්ථාවර කමිටු හෝ තත්කාර්ය කමිටු සංඛ්‍යාවක් පත් කිරීම හා ඒවායේ විෂය කරුණු නියම කිරීම, ඒ කමිටුවල වාර්තා සලකා බැලීම හා වෙනස් කිරීම් ඇතිව හෝ නැතිව ඒ වාර්තා අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම ;

(ට) විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව හා අදාළ අධ්‍යයන මණ්ඩලය හෝ අධ්‍යයන මණ්ඩල විමසා අධ්‍යයන පාඨමාලාවලට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා නිශ්චය කිරීම ;

(ඩ) ප්‍රයෝජනයට නොයොදවා ඇති යම් ආදායමක් ද ඇතුළුව, ආයතනයට අයත් කවර මුදලක් වුව ද, භාර ආඥාපනතේ 20 වන වගන්තියේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන යටතේ භාරකාර මුදල් නීත්‍යානුකූලව ආයෝජනය කළ හැකි යම් සුරැකුම්පතක ආයෝජනය කිරීම; හෝ විශ්වවිද්‍යාලයේ අනුමතය ඇතිව ශ්‍රී ලංකාව තුළ නිශ්චල දේපළ මිලදී ගැනීම සඳහා එවැනි යම් මුදලක් ආයෝජනය කිරීම හෝ එවැනි ආයෝජන වෙනස් කිරීම හෝ ඒ මුදල්වලින් වියදම සඳහා වහා අවශ්‍ය නොවන්නා වූ යම් කොටසක් විශ්ව විද්‍යාලය අනුමත කරනු ලබන යම් බැංකුවක ස්ථාවර තැන්පතුවක් ලෙස තැන්පත් කිරීම ; සහ

(ණ) මේ නියමාවලිය මගින් හෝ වෙනත් යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන සලසා ඇති පරිදි ආයතනයේ බලතලවල ප්‍රතිඵලයක් වන හෝ ඒ බලතලවලට ආනුෂංගික වන්නා වූ, ආයතනයේ අනෙක් සියලු බලතල ක්‍රියාත්මක කිරීම.

(3) මණ්ඩලය විසින්, යම් අධ්‍යයන කාරණයක් පිළිබඳ කිසිදු යෝජනා සම්මතයක් ඊට අදාළ අධ්‍යයන මණ්ඩලයට පළමුව ස්වකීය මතය වාර්තාගත කොට මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීමෙන් අනතුරුව මිස, සම්මත නොකළ යුතු ය.

එසේ වුව ද, විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව මිස එසේ අනුමත කරන කිසිදු යෝජනා සම්මතයක් පරිදි ක්‍රියා කිරීම නොකළ යුතු ය.

මේ ඡේදයේ "අධ්‍යයන කාරණය" යන්නෙන්, අදාළ අධ්‍යයන මණ්ඩලයේ පාලනයට සහ සාමාන්‍ය විධානයට යටත් කවර හෝ යම් කාරණයක් අදහස් වේ.

12. (1) ආයතනය විසින්, පහත සඳහන් එක් එක් විශේෂඥ වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍ර සම්බන්ධයෙන් සහ මණ්ඩලයේ සහ විශ්වවිද්‍යාලයේ නිර්දේශ මත කොමිෂන් සභාව විසින් ඉගැන්වීම් සහ පුහුණු කිරීම් අනුමත කිරීමට අපේක්ෂා කරනු ලබන වෙනත් විශේෂඥ වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ද අධ්‍යයන මණ්ඩල පිහිටුවිය යුතු ය:-

(අ) සායනික විද්‍යා ;
(ආ) මූලික වෛද්‍ය විද්‍යා ;
(ඇ) ව්‍යවහාර වෛද්‍ය විද්‍යා ; සහ
(ඈ) සෞඛ්‍ය විද්‍යා.

(2) අධ්‍යයන මණ්ඩලය ආයතනයේ ප්‍රධාන ශාස්ත්‍රීය මණ්ඩලය විය යුතු ය.

(3) යම් වලංගු හේතුවක් නිසා අධ්‍යයන මණ්ඩලයකට හෝ විශේෂඥ මණ්ඩලයකට නියමිත සාමාජිකයන් සංඛ්‍යාව පත් කිරීමට නොහැකිවන අවස්ථාවක දී, එම පුරප්පාඩු පිරවීමට සුදුසුකම්ලත් තැනැත්තන් පත් කිරීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය.

(4) මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කරගනු ලබන දෝෂාරෝපණ යෝජනාවක් මත, අධ්‍යයන මණ්ඩල හෝ විශේෂඥ මණ්ඩල විසුරුවා හැරීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය.

13. (1) එක් එක් අධ්‍යයන මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) අධ්‍යක්ෂවරයා;

(ආ) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සහ දන්ත වෛද්‍ය පශ්චාත් පුහුණු පාඨමාලාව සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ දන්ත වෛද්‍ය විද්‍යා පීඨය විසින්, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයන්, මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතරින්, නම් කරනු ලබන අදාළ විශේෂඥ ක්ෂේත්‍රයේ හෝ වෙනත් විශේෂඥ වෛද්‍ය ක්ෂේත්‍රවල සාමාජිකයන් තුන්දෙනෙකු;

(ඈ) පීඨයේ පීඨාධිපති විසින් නම් කරනු ලබන, පනත යටතේ පිහිටුවන ලද එක් එක් වෛද්‍ය පීඨවලින් අදාළ විශේෂඥ ක්ෂේත්‍රයේ හෝ වෙනත් විශේෂඥ වෛද්‍ය ක්ෂේත්‍රවල ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු (මූලාසන), මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු, අංශාධිපති හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ;

(ඈ) අදාළ එක් එක් පුහුණු මධ්‍යස්ථානවලින්, ආයතනවලින්, අධ්‍යයන පීඨවලින් සහ අධ්‍යයන අංශවලින් නියෝජිතයකු; සහ

(ඉ) අදාළ රජයේ හෝ පුද්ගලික අංශයේ ආයතනවල සේවය කරන හෝ සේවය කර ඇති කීර්තිමත් ජ්‍යෙෂ්ඨ විද්වතුන් හෝ උපදේශකවරු අතරින් මණ්ඩලය විසින් නම් කරනු ලබන සාමාජිකයින් දෙදෙනකු

(2) යම් අධ්‍යයන මණ්ඩලයක් විසින්, මණ්ඩලයේ එකඟත්වය ඇතිව, නිශ්චිත කාර්යයක් සඳහා, නිශ්චිත කාල පරිච්ඡේදයකට එක් තැනැත්තකු හෝ එක් තැනැත්තකුට වැඩි සංඛ්‍යාවක් සහය වීමට සම්බන්ධ කරගත හැකි ය. එසේ සම්බන්ධ කරගත් කිසිම තැනැත්තෙකුට ඡන්දයෙන් පත්වීම සඳහා ඉදිරිපත්වීමට හෝ එම අධ්‍යයන මණ්ඩලයේ රැස්වීමක දී ඡන්දය දීමට හෝ අයිතියක් නොමැති විය යුතු ය.

(අ) අධ්‍යයන මණ්ඩලයක යම් සාමාජිකයකු නියමිත කාලයට පෙර ධුරයෙන් ඉවත් වන්නේ නම් මිස, ඔහු පත් කරනු ලැබුවේ යම් දිනක සිට ද, එදින සිට ගණන් ගැනෙන වසර තුනක කාල සීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් මිස නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේ ය. :

එසේ වුව ද, පත් කරනු ලැබූ යම් සාමාජිකයකු, ස්වකීය ධුර කාලයට පෙර ඔහුගේ ධුරය අත්හරිනු ලබන අවස්ථාවක දී, ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින් සිය ධුරය කලින් අත් හරින්නේ නම් මිස, පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව තිබූ ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.:

එසේම තවදුරටත්, යම් පත් කරනු ලැබූ එක් එක් සාමාජිකයෙක් තමා අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු වූයේ යම් තත්වයක් හෝ සාමාජිකත්වයක් අනුව ද, ඒ තත්වය හෝ සාමාජිකත්වය දරන තාක් පමණක් ඔහු තම ධුරය දැරිය යුතු අතර, පුහුණු ඒකකයෙන්, මධ්‍යස්ථානයෙන්, විශ්වවිද්‍යාලයෙන්, පීඨයෙන් හෝ අධ්‍යයන මණ්ඩලයෙන් ඉල්ලා අස්වීමේ දී, විශ්‍රාම යාමේ දී හෝ මාරුවීමේදී සාමාජිකයකු වීම අවසන් වන්නේ ය. විද්‍යාල සහ සංගමයන් නියෝජනය කරන සාමාජිකයන් වයස අවුරුදු හැටපහේ දී සාමාජිකයන් වීම අවසන් වන්නේ ය.

(ආ) අධ්‍යක්ෂවරයා වෙත යවනු ලබන තම අත්සන යටතේ වූ ලිපියක් මගින් අධ්‍යයන මණ්ඩලයේ යම් සාමාජිකයකුට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(ඇ) නොපැමිණීමේ අවසරය නොලබා අධ්‍යයන මණ්ඩලයේ අඛණ්ඩ රැස්වීම් තුනකට සහභාගිවීමට අපොහොසත්වන අධ්‍යයන මණ්ඩලයේ යම් පත් කරනු ලැබූ සාමාජිකයකු, අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් වූ තම ධුරය අත්හරිනු ලැබුවා සේ සලකනු ලැබිය යුතු අතර, එසේ ඇතිවන පුරප්පාඩුව පිරවීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් සුදුසු තැනැත්තකු පත්කිරීමට පියවර ගනු ලැබිය යුතුය.

(4) එක් එක් අධ්‍යයන මණ්ඩලයට ඒ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන් විසින් එහි සාමාජිකයන් අතරින් තෝරා පත් කරගනු ලැබිය යුතු සභාපතිවරයකු සිටිය යුතුය.

(5) එක් එක් අධ්‍යයන මණ්ඩලයට ඒ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන් විසින් එහි සාමාජිකයන් අතරින් තෝරාපත් කරගනු ලැබිය යුතු ලේකම්වරයකු සිටිය යුතුය.

(6) යම් අධ්‍යයන මණ්ඩලයක රැස්වීමක් සඳහා අවශ්‍ය ගණ පූර්ණය අතිරේකව යොදවා ගනු ලැබූ සාමාජිකයන් සිටී නම්, ඔවුන් හැර මුළු සාමාජිකත්වයෙන් තුනෙන් එකක් විය යුතුය.

(7) එක් එක් අධ්‍යයන මණ්ඩලයක්, එක් වසරක් සඳහා අවම වශයෙන් රැස්වීම් දහයකට නොඅඩු සංඛ්‍යාවක් පැවැත්වෙන පරිදි කවර අවස්ථාවක වුවද, රැස්විය යුතුය.

14. (1) නියමාවලියේ, පනතේ සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව අදාළ විශේෂඥ වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයන්හි ඉගැන්වීම, අධ්‍යාපනය, පර්යේෂණ, පුහුණු සහ විභාග පිළිබඳ පාලනය සහ මෙහෙයවීම සෑම අධ්‍යයන මණ්ඩලයක් ම සතු විය යුතුය.

(2) (1) වන අනුඡේදයෙන් සෑම අධ්‍යයන මණ්ඩලයකට ම පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව අදාළ විශේෂඥ වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍ර සම්බන්ධ පහත දැක්වෙන බලතල, කාර්ය හා කර්තව්‍ය සෑම අධ්‍යයන මණ්ඩලයක් විසින් ම භාවිත කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතුය.

(අ) මණ්ඩලය විසින් එයට යොමු කරන ලද කවර කරුණක් හෝ පිළිබඳව සලකා බැලීමෙන් පසු වාර්තා කිරීම ;

(ආ) විශේෂඥ වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයන්ට අදාළ අධ්‍යයන පාඨමාලා, පුහුණු වැඩසටහන් හෝ වැඩසටහන් සහ විභාග හා සම්බන්ධිත සියලු කාරණා පිළිබඳව නිර්දේශ හා වාර්තා මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ;

(ඇ) යම් විශේෂිත විෂයක් හෝ විෂයන් පිළිබඳව සලකා බැලීමේ සහ වාර්තා කිරීමේ කාර්යය සඳහා අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන්ට අමතරව වෙනත් තැනැත්තන් ඇතුළත් විය හැකි කමිටු පත් කිරීම ;

(ඈ) අධ්‍යයන පාඨමාලා සහ විභාගවලට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සඳහා වන නියම කිරීම් මණ්ඩලයට නිර්දේශ කිරීම ;

(ඉ) අදාළ විශේෂඥ වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයේ අධ්‍යයන පාඨමාලා සහ විභාගවලට අදාළව නියෝග කෙටුම්පත් කිරීම;

(ඊ) ආචාර්යවරුන් සහ පරීක්ෂකවරුන් වශයෙන් පිළිගැනීමට සුදුසු තැනැත්තන් මණ්ඩලයට නිර්දේශ කිරීම;

(උ) විශේෂඥයන් ලෙස පිළිගත යුතු අදාළ විශේෂඥ වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයේ නියමිත විභාග සමත් වී ඇති තැනැත්තන් මණ්ඩලයට නිර්දේශ කිරීම;

(ඌ) පාඨමාලා, අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණ, ශිෂ්‍යාධාර, පදක්කම් සහ වෙනත් ත්‍යාග සඳහා ඇති තරඟකාරීත්වයේ ස්වභාවය සහ කොන්දේසි මණ්ඩලයට නිර්දේශ කිරීම ; සහ

(එ) (i) පවත්නා අධ්‍යයන මණ්ඩලය ප්‍රතිසංවිධානය කිරීම සඳහා සැලසුම් සහ නව අධ්‍යයන මණ්ඩල පිහිටුවීම; සහ

(ii) අදාළ අධ්‍යයන මණ්ඩලවලට වෛද්‍ය විද්‍යා විශේෂඥ ක්ෂේත්‍ර පැවරීම; පිළිබඳව මණ්ඩලයට නිර්දේශ කිරීම;

15. ආයතනයේ මුදල් වර්ෂය, ආණ්ඩුවේ මුදල් වර්ෂය ම වන්නේ ය.

16. (1) ආයතනයට (මෙහි මින්මතු “අරමුදල” යනුවෙන් සඳහන් කරනු ලබන) වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් තිබිය යුතු අතර, පහත සඳහන් මුදල් එයට ගෙවිය යුතු ය.

(අ) යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට අනුකූලව ආයතනයට ගෙවිය යුතු ගාස්තු;

(ආ) පරිත්‍යාග, ප්‍රදාන සහ ත්‍යාගවලින් ලැබෙන ආදායම්;

(ඇ) පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදනය කරන ලදුව විශ්වවිද්‍යාලය හෝ කොමිෂන් සභාව විසින් ආයතනයට ආධාර වශයෙන් වෙන් කරනු ලබන්නා වූ මුදල් ; සහ

(ඈ) ආයතනයට කවර ප්‍රභවයකින් හෝ ලැබෙන්නා වූ සියලු මුදල්.

(2) යම් මාසයක් තුළ අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් ප්‍රමාණයන් පිළිබඳ සාරාංශයක්, උචිත ආදායම් ශීර්ෂ යටතේ වර්ග කර, ඊළඟ ඉදිරි මාසය අවසන් වීමට පෙර අධ්‍යක්ෂවරයා විසින් කොමිෂන් සභාව වෙත දැනගැනීම පිණිස ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(අ) මණ්ඩලය විසින් කලින් කල නියම කරනු ලබන පිළිවෙළට හා ආකාරයට ආයතනයේ ගිණුම් තැබීම.

(ආ) අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් භාරගැනීම සහ ඒ මුදල් නිසි ගිණුම් ශීර්ෂවලට බැර කිරීම.

(ඇ) බලයදෙනු ලැබූ සියලු ගෙවීම් කිරීම ; සහ

(ඈ) විශ්වවිද්‍යාලය හෝ කොමිෂන් සභාව විසින් නියම කරන ලද අවශ්‍ය ත්‍රෛවාර්ෂික ඇස්තමේන්තු සහ ඉදිරි වර්ෂය සඳහා වාර්ෂික මුදල් ඇස්තමේන්තු මණ්ඩලය සඳහා සකස් කිරීම.

අධ්‍යක්ෂවරයාගේ කාර්ය වන්නේ ය.

එසේ වුවද, නිශ්චිත කාර්ය සඳහා කරනු ලබන ප්‍රදානවලින් හෝ නිශ්චිත අරමුණු සඳහා වූ පරිත්‍යාගවලින් උපචිත වන ආදායම් සම්බන්ධයෙන් වෙනම ගිණුම් පෙන්නුම් කළ යුතු අතර, ආයතනයේ සාමාන්‍යය කාර්ය සඳහා හෝ ඒ ප්‍රදාන හෝ පරිත්‍යාග කරනු ලැබුවේ පිළිවෙළින් යම් කාර්ය හෝ අරමුණු සඳහා ද, ඒ කාර්ය හෝ අරමුණ නොවන කරුණු සඳහා ඒ ආදායමෙන් කිසිදු ගෙවීමක් සිදු කරනු නොලැබිය යුතු ය.

18. (1) විශ්වවිද්‍යාලය සහ කොමිෂන් සභාව විසින් කලින් කළ නියම කරනු ලබන පිළිවෙළට හා ආකාරයට සහ හැකි පරිදි එසේ නියම කරනු ලබන තොරතුරු ඇතුළත් කොට, සිය ආයතනයේ කටයුතුවලට අදාළ වාර්ෂික ගිණුම් හා සංඛ්‍යා ලේඛන පිළිබඳ ප්‍රකාශයක් ආයතනය විසින් පිළියෙල කළ යුතුය.

(2) ආයතනයේ ගිණුම් පොත් ආයතනයේ කාර්යාලයේ පවත්වාගෙන යා යුතු ය.

(3) පනතේ, නියමාවලියේ, යම් උචිත සාධන පත්‍රයක සහ මුදල් රෙගුලාසිවල විධිවිධානවලට යටත්ව ආයතනය විසින් මූල්‍යමය ස්වාධීනත්වය පවත්වාගෙන යා යුතුය.

19. උසස් අධ්‍යාපන ආයතනයක ගිණුම් විගණනයට අදාළ ව පනතේ, xiii වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ආයතනයේ ගිණුම් විගණයට සහ ඒ සම්බන්ධයෙන් අදාළ වන්නේය.

20. (1) විශ්වවිද්‍යාලයේ එකඟත්වය සහ කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂම ව ක්‍රියාත්මක කිරීම, සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි ආයතනය විසින් සලකනු ලබන නිලධරයන්ගෙන්, ආචාර්යවරයන්ගෙන් සහ වෙනත් සේවකයන්ගෙන් ආයතනයේ කාර්ය මණ්ඩලය සමන්විත විය යුතු ය.

(2) අවස්ථාවෝචිත පරිදි, විශ්වවිද්‍යාලය විසින් ස්වකීය කාර්ය මණ්ඩලයෙන් පත් කරනු ලබන මුදා හැරීම මගින් හෝ කොමිෂන් සභාව හෝ විශ්ව විද්‍යාලය විසින් කරනු ලබන පත්වීම් මගින් හෝ ආයතනයට කාර්ය මණ්ඩලයට ලබා දිය යුතුය. පනතේ x වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ආයතනයේ කාර්ය මණ්ඩලයට කෙරෙන පත් කිරීම කෙරෙහි හා පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන්නේය.

(3) විශ්වවිද්‍යාලයේ නිලධරයකු, ආචාර්යවරයකු හෝ වෙනත් සේවකයකු ආයතනයේ සේවය සඳහා පූර්ණ කාලීන පදනමක් මත මුදා හැර ඇති අවස්ථාවක, විශ්වවිද්‍යාලයේ ඔහුගේ නිත්‍ය තනතුරේ හිමි වේතනය හා දීමනා ආයතනය විසින් ඔහුට ගෙවනු ලැබිය යුතු ය. වෙනත් ඕනෑම අවස්ථාවක දී විශ්වවිද්‍යාලය විමසීමෙන් පසු හා කොමිෂන් සභාවේ අනුමතය ඇතිව ආයතනය විසින් නිශ්චය කරනු ලබන වෙනත් දීමනා ආයතනය විසින් අදාළ නිලධරයාට, ආචාර්යවරයාට හෝ වෙනත් සේවකයකුට ගෙවනු ලැබිය හැකිය.

(4) අධ්‍යක්ෂවරයාගේ සහ විශ්වවිද්‍යාලයේ විධානයට සහ විනය පාලනයට ආයතනයේ කාර්ය මණ්ඩලය යටත් විය යුතුය.

21. ආයතනයේ යම් බල මණ්ඩලයකට හෝ වෙනත් මණ්ඩලයකට යම් තැනැත්තකු යථා පරිදි තෝරාපත් කර ගනු ලැබ ඇත්ද, පත් කරනු ලැබ ඇත්ද, නම් කරනු ලැබ ඇත්ද හෝ අතිරේකව යොදනු ලැබ ඇත් ද නැතහොත් යම් තැනැත්තකු ආයතනයේ යම් බල මණ්ඩලයක හෝ වෙනත් මණ්ඩලයක සාමාජිකයකුව සිටීමට හිමිකම් ලබන්නේ ද යන්න පිළිබඳ යම් ප්‍රශ්නයක් පැන නැගුණු අවස්ථාවක දී, එම ප්‍රශ්නය කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු අතර, ඒ පිළිබඳව කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක වන්නේය.

22. ආයතනයේ යම් බල මණ්ඩලයක හෝ වෙනත් මණ්ඩලයක කිසිඳු ක්‍රියාවක්, යෝජනා සම්මතයක් හෝ ක්‍රියා මාර්ගයක්, එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීමේ හේතුව මත පමණක් අවලංගු නොවන්නේය.

23. නියමාවලිය ක්‍රියාත්මක භාවයට එළඹීමෙන් පසුව සහ පනතේ විධිවිධානවලට යටත් ව, විවිධ විශේෂඥ වෛද්‍ය ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීමේ හා පිරිනැමීමේ බලතල විශ්ව විද්‍යාලයට තිබිය යුතු ය.

එසේ වුවද, විශ්වවිද්‍යාලය විසින්, ආයතනයේ නිර්දේශය මත පමණක් පශ්චාත් උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සහ පිරිනැමීම සිදු කළ යුතු ය.

24. නියමාවලියට සිදු කරන ඕනෑම සංශෝධනයක් මණ්ඩලය, සනාතන සභාව, පාලක සභාව සහ කොමිෂන් සභාව විසින් අනුමත කළ යුතු ය.

25. මෙම නියමාවලියේ -

"පනත" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අදහස් වේ.

"උචිත සාධන පත්‍රය" යන්නෙන්, විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවලට අනුකූලව සාදනු ලැබූ යම් නියමයක්, නියමාවලියක්, චක්‍රලේඛයක්, ප්‍රඥප්තියක්, අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් අදහස් වේ ;

"කොමිෂන් සභාව" යන්නෙන්, විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපිත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ.

"විශේෂඥ වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රය" යන්නෙන්, කලින් කලට ආයතනයේ සහ විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන යම් විශේෂඥ ක්ෂේත්‍රයක් අදහස් වේ.

"ආචාර්යවරයා" යන්නෙන්, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු, I වන ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු, II වන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු, කථිකාචාර්යවරයකු, සහ කථිකාචාර්යවරයකු (පරිවාස) සහ ආචාර්ය තනතුරක් ලෙස නියමාවලිය මගින් ප්‍රකාශයට පත්කරන ලද යම් තනතුරක් දරන්නකු අදහස් වේ.

10-138

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.